**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2013/14**

**2017 අප්‍රේල් - ජූනි**

**සමාජීයවිද්‍යා පීඨය**

**ජනසන්නිවේදනය - MACO – E 2015**

**භාෂාව හා සන්නිවේදනය**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. 'භාෂාවේ කාර්යභාරය පුළුල් වූවකි.' තෝරාගත් නිර්වචන **පහක්** (05) ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. 'යම් සංස්කෘතියක් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී එම සංස්කෘතිය නියෝජනය වන ප්‍රජාව භාවිත කරන භාෂාව හැදෑරීම ප්‍රයෝජනවත් වේ.' නිදසුන් සහිතව ඔබගේ මතය දක්වන්න.

03. i. ජනවහර යනු කුමක්දැයි පහදා ජනවහර හැදෑරීමේ අවශ්‍යතාව පිළිබඳ පැහැදිලි කරන්න.

    ii. සංදේශයක අන්තර්ගතය පෝෂණය සඳහා ජනවහර උපයෝගී කරගෙන ඇති ආකාරය පිළිබඳ තෝරාගත් මාධ්‍යයකට විශේෂිතව නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

04. ගුවන් විදුලි මාධ්‍යයේ භාෂා භාවිතයේ විශේෂතා පිළිබඳව විවරණයක යෙදෙන්න.

05. තීරු ලිපි භාෂා භාවිතයේ විශේෂතා පිළිබඳව තෝරාගත් තීරු රචකයින් **හතර** (04) **දෙනෙකුගේ** තීරු ලිපි ඇසුරෙන් පැහැදිලි කරන්න.

06. 'රූපය ප්‍රබල ප්‍රකාශන මාධ්‍යයකි.' දෙස්-විදෙස් සිනමා නිර්මාණ නිදසුන් වශයෙන් ගෙන පහදන්න.

07. 'සාහිත්‍ය නිර්මාණකරණයේදී විවිධ රස සහ භාව ප්‍රකාශනයෙහිලා භාෂාව මහෝපකාරී වේ.' නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් **හතරක්** (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

    i. භාෂාවේ ප්‍රභවය පිළිබඳ නිර්මාණවාදී මතය
    ii. පුවත්පත් සිරස්තල භාෂාව
    iii. දැන්වීම්කරණය හා රූප භාෂාව
    iv. සමාජ අවස්ථා හා භාෂා භාවිතය
    v. පානම්පත්තුවේ ජනවහර
    vi. සංඥාර්ථවේදය

**********************